C
376
SAM

# ශ්‍රී ලංකාවේ දුරස්ථ ගුරු අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනයක්.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධව අවශ්‍යතා පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධයකි.

නිබන්ධක

සී.එස්.සමරසිංහ.

අධ්‍යාපනවේදී 1976

උපදේශක:

අධ්‍යාපන විද්‍යා අංශාධිපති,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,

ආර්.පී.ලියනගේ මහතා.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

1991

438220

# සාර සංග්‍රහය

අධ්‍යාපනය තුළින් කඩිනම් සංවර්ධනයක් අපේක්ෂා කරන මෙවන් යුගයක, අධ්‍යාපනික ක්‍රියාවලියේ සුවිශේෂී ස්ථානයක් හිමි කරගන්නා ගුරුවරයා, කාලීන අවශ්‍යතාවයනට සරිලන අයුරින් සකස් කිරීම ඉතා වැදගත් වූද, භාරධූර වූද, කාර්යයකි.

මෙම කාර්යය ඉටු කිරීම සඳහා ගතවූ දශක හතරක පමණ කාලයක් තුළ, විශ්වවිද්‍යාල වල අධ්‍යාපන අංශ විසින් හා ගුරු විද්‍යාල විසින් කරගෙන ආ පූර්ණකාලීන පාඨමාලා පැවැත්වීමේ වැඩ පිළිවෙළ ගුණාත්මක අතින් උසස් සාර්ථක ප්‍රයත්නයක් වුවත්, සීඝ්‍රයෙන් වැඩිවූ නුපුහුණු ගුරු සංඛ්‍යාව ගැන බලන විට, ප්‍රමාණාත්මක වශයෙන් නම් කිසිසේත් ප්‍රමාණවත් නොවීය. එම අඩුව පිරිමැසීම සඳහා විකල්ප වැඩ පිළිවෙළක් ලෙස, ප්‍රමාණාත්මක වශයෙන් පුළුල් ව කරගෙන ආ වැඩ පිළිවෙළක් වන, දුරස්ථ ගුරු අධ්‍යාපන වැඩ පිළිවෙළ තුළින් ගුරු අධ්‍යාපනය ලබාදුන් ආකාරය අධ්‍යයනය කර, මෑත දශකයේ සීඝ්‍රයෙන් වැඩි වූ ගුරු සංඛ්‍යාවනට අනාගතයේදී දිය යුතු ගුරු අධ්‍යාපන වැඩ පිළිවෙළක් ගැන, විමසා බැලීමද අරමුණු කරගෙන,

"ශ්‍රී ලංකාවේ දුරස්ථ ගුරු අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනයක්"

"A Study of Distant Teacher Education Programme in Sri Lanka."

යන මාතෘකාව මගේ ශාස්ත්‍රපති නිබන්ධය සඳහා මම තෝරා ගතිමි.

මෙම අධ්‍යයනයේදී මා වැඩි වශයෙන්ම අනුගමනය කලේ ඓතිහාසික හා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයයි.

නිබන්ධය අවසානයෙහි ග්‍රන්ථ නාමාවලිය යටතේ සඳහන් කර ඇති කලින් කලට පළ කරන ලද, දේශීය හා විදේශීය පත පොත හා පළ නොකළ කෘතීන් කිහිපයක් පරිශීලනය කිරීමද, දුරස්ථ අධ්‍යාපන ආයතන වලින් ලබා ගත් තොරතුරුද, දුරස්ථව ගුරු පුහුණුව ලද ගුරුවරුන්ගෙන් ලත් අදහස්ද, මෙම අධ්‍යයනය ගොණු කිරීමේදී ඉවහල් කරගතිමි.

මෙම නිබන්ධය පරිච්ඡේද හතකි , පිටු 284 ක් හා ග්‍රන්ථ නාමාවලි හා උපග්‍රන්ථ පිටු 43 කින්ද සමන්විතය.

මෙහි පළමුවන පරිච්ඡේදයෙන් ප්‍රස්තුතයට පිවිසීමට අර්ථවත් පදනමක් සකස් කරගනු වස් ගුරු අධ්‍යාපන සංකල්පය ඉතාමත් සංක්ෂිප්තව පැහැදිලි කළෙමි. දුරස්ථ ගුරු අධ්‍යාපනය (Distance Teacher Education ) විස්තර කිරීමට පෙර දුරස්ථ අධ්‍යාපන සංකල්පය ( Distance Education ) හැඳින්වීම වඩාත් යෝග්‍ය යැයි හැඟුනෙන් එසේ කළෙමි. ඒ සඳහා කලින් කලට විවිධ අධ්‍යාපනඥයින් ඉදිරිපත් කළ නිර්වචන හා ඔවුන් දුරස්ථ අධ්‍යාපන සංකල්පය දෙස නෙත් යොමු කළ දෘෂ්ටි කෝණයන් ඔස්සේ ගොඩනැඟූ සංකල්පයන්ද, උපයෝගී කරගතිමි. එයින් වර්තමාන දුරස්ථ අධ්‍යාපන සංකල්පයෙන් හැඟෙන පුළුල් අර්ථය පැහැදිලි කිරීමට හැකි වී යයි මම සිතමි. අනතුරුව දුරස්ථ අධ්‍යාපන ක්‍රමය කෙතෙක් දුරට ගුරු අධ්‍යාපනයට යොදා ගැනීම යෝග්‍යදැයි විමසීමට ප්‍රයත්න දැරීමි. ඒ සඳහා ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් කිහිපයක ක්‍රියාත්මක කෙරෙන දුරස්ථ ගුරු අධ්‍යාපනික වැඩ සටහන් ඉතාමත් ලුහුඬින් විමර්ශණය කළෙමි.

දෙවැනි පරිච්ඡේදයෙන් මා ඉදිරිපත් කළේ ලංකාවේ ගුරු අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ පවත්නා කාලීන අවශ්‍යතාවයේ ස්වභාවය විමසමින්, එම අවශ්‍යතාවය සපුරාලීමට දුරස්ථව සිදු කරන අධ්‍යාපනය ඊට අනුවර්තනය කළ හැකි දැයි සොයා බැලීමයි. ඒ සඳහා නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දශක හතරක වකවානුව තුළ සිදුවූ වර්ධනය සංඛ්‍යාත්මක වශයෙන්, ගුණාත්මක වශයෙන් හා විෂය මාලා වෙනස් වීම් තුළින් සිදු කළ ආකාරය විමසා බැලුවෙමි.

එම පරිච්ඡේදයෙහිම දෙවැනි කොටසින් 1970 දශකය වනවිට, වත්මන් දුරස්ථ ක්‍රමයේ මූලාරම්භය ලෙසින් සැලකෙන තැපැල් මාර්ගික ගුරු පුහුණු පාඨමාලා ක්‍රමයේ ආරම්භයත්, එතැන් සිට ගුරු පුහුණු ක්ෂෙත්‍රයට එක්වූ දුරස්ථ වැඩමාලාවනුත් පිළිබඳව අධ්‍යයනය කළෙමි. එයින් මා අපේක්ෂා කළේ දශකයෙන් දශකය ගුරු අධ්‍යාපන අවශ්‍යතා පූරණයට දුරස්ථ ක්‍රමය ආයකවූ ආකාරය හා ප්‍රමාණය පරීක්ෂා කර බැලීමයි.

නවර අධ්‍යයනයකදී වුවද, ඊට අදාල ඉතිහාසය විමසීම යෝග්‍ය වන බැවින්, තෙවැනි පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ දුරස්ථ ගුරු අධ්‍යාපනයේ ඉතිහාසය දැක්වීමි. 1970 දශකයේ සිට 1990 දශකය තෙක් ක්‍රියාත්මක කරන ලද දුරස්ථ ගුරු පුහුණු වැඩමාලාවන්ගේ ආරම්භයන් විකාශනයන් එයට අන්තර්ගත කළෙමි.

සිව්වැනි පරිච්ඡේදයෙන් දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කෙරෙන දුරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලා පුළුල් ලෙස විමසුමට ලක් කළෙමි. මා මෙහිදී දැනට ක්‍රියාත්මක කෙරෙන යනුවෙන් අවධාරණය කර ඇත්තේ 1980 දශකය මැද භාගයේ සිට සංශෝධන සහිතව පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්ය. ආයතන නිහිපයක ප්‍රමුඛත්වයෙන් විවිධ මට්ටම් සඳහා ක්‍රියාත්මක කරන එම ගුරු අධ්‍යාපන පාඨමාලා විමසීමේදී ඒවායේ පහත සඳහන් උපාංග පිළිබඳ අවධානය යොමු කළෙමි.

1. පාඨමාලාවේ අංග.
2. විෂය මාලාව.
3. ඉගෙනුම් රටාව
4. ඇගයීම් රටාව සහ
5. පාඨමාලා පරිපාලන කටයුතු.

ඒ තුළින් දැනට පවත්වාගෙන යනු ලබන දුරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලාවන්ගෙන් ලබන ඵලයෙහි අර්ථවත් බව පරීක්‍ෂා කිරීමට ප්‍රයත්න දැරීමි.

ගුරු අධ්‍යාපනය දුරස්ථ පාඨමාලාවන් තුළින් ලද අයටත්, ඒ අයගෙන් අධ්‍යාපන ක්‍ෂෙත්‍රයට ලැ බෙන ප්‍රතිඵලයේ ස්වභාවය පිළිබඳ කිසියම් අවබෝධයක් ලබා ගැනීමෙනුත්, එම පාඨමාලා හැදෑරීමේදී ඔවුන් මුහුණපාන දුෂ්කරතා අනාවරණය කර ගැනීමෙනුත්, එම පාඨමාලා අනාගතයේදී සකස් කළ යුතු ආකා රය පිළිබඳ, අර්ථවත් යෝජනා ඉදිරිපත් කිරීම අරමුණු කරගෙන තෝරාගත් නියැදියක් තුළින් තොරතුරු අධ්‍යයනය කළෙමි. ඒ සඳහා අදාල ගුරුවරුන් හා ඔවුන්ගේ විදුහල්පති වරුන්ගෙන් තොරතුරු ලබා ගතිමි. එක් එක් කොටසට අදාල පරිදි ප්‍රශ්නාවලීද, සම්මුඛ සාකච්ඡා හා නිරීක්‍ෂණ ද ඒ සඳහා යොදා ගතිමි.

අවසන් පරිච්ඡේදයෙන් අධ්‍යයනයෙන් හා සමීක්ෂණයෙන් අනාවරණය වූ, දුබලතා වලට පිළියම් යෝජනා කළෙමි. සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ වර්තමානයට හා අනාගතයට වඩාත් යෝග්‍ය වන ලෙසින් දුරස්ථ ගුරු අධ්‍යාපනික වැඩ සටහන් වල අවධානය යොමු කළ යුතු අංශ හා නව යෝජනාද, ඉදිරිපත් කළ අතර පසු පරීක්ෂකයන්ටද, සේවිය යුතු, විමසිය යුතු, අවස්ථා ඇති ක්ෂේත්‍ර පිළිබඳ ඉඟිද දැක්වීමි.